# හද රිදවන මතක සුවඳ සහ අන්ධ භක්තිය - 5

මම මීට පෙර ලිපියේ දැක්වූ අන්දමට රෝහිත මුණසිංහ සහෝදරයා විසින් ජනතා විමුක්ති පෙරමුණට සම්බන්ධව සිට පසුව එයින් ඉවත් කරන ලද සහ ඉවත් වූ අය ගැන දක්වා තිබෙන වැරදි සහගත කරුණු කිහිපයක් ගැන සාකච්ඡා කරන්නට පටන් ගනිමි.

ජනතා විමුක්ති පෙරමුණේ ඉතිහාසය තුල එහි ගමන් මගට කාන්තාවන් කිහිප දෙනෙක්ම මහත් ලෙස බලපෑම් කර ඇතැයි රෝහිත මුණසිංහ සහෝදරයා විශ්වාස කරන බව මීට පෙර පල කරන ලද 'සන්නස' කලාපවලින් දුටුවා. ඔහු එයින් තිදෙනෙකු ගැන විස්තර ඉදිරිපත් කොට තිබේ. මේ තිදෙනා කරන ලදැයි කියන අහිතකර දේවල් පිළිබඳව මා දන්නා සත්‍ය කරුණු සාකච්ඡා කරන්නට පෙර මුණසිංහ සහෝදරයා විසින් මේ දේවල් ඉදිරිපත් කොට තිබෙන්නේ කුමණ සංදර්භයක් තුලද යන්න ගැන මේ අවස්ථාවේ දී කරුණු කිහිපයක් පැවසීම


රෝහණ විජේවීර සහෝදරයා

උචිත වේ යයිද එය අනාගතයේ මේ දේවල් ගැන වඩා විෂයමූලික ලෙසත් වැදගත් ලෙසත් සාකච්ඡා කරන්නට හේතු කාරක වෙනු ඇතැයිද මම කල්පනා කරමි.

මුණසිංහ සහෝදරයා විසින්ම පිළිගෙන ඇති අන්දමට ඔහු ඉදිරිපත් කොට තිබෙන දේවල් පදනම් වී ඇත්තේ, එක් අතකින්, ජනතා විමුක්ති පෙරමුණේ අධ්‍යාපන පංති සහ කඳවුරු පවත්වන විට 'පක්ෂ ඉතිහාසය' පිළිබඳ නිල වශයෙන් සාකච්ඡා කරන ලද කරුණු වලට අමතරව "කමිටුවල සිටින අප අප අතර පමණ"ක් "නොනිල මට්ටමේ" කෙරුණු "අභ්‍යන්තර ඕපාදූප" මතයි. තවත් අතකින්, එම කරුණු සාකාච්ඡා කෙරෙන්නේ මීට පෙර ලිපියේ මා දක්වා ඇති අන්දමට පක්ෂ නායකත්වයේ සහ මුණසිංහ සහෝදරයාද ඇතුළු කමිටුවල සිටි සහෝදරවරුන් අතර පැවති පුරුෂ ආධිපත්‍යවාදී නිර්-සමාජවාදී මති මතාන්තර සහ දෘෂ්ඨි කෝණ අනුවයි.

රෝහණ සහෝදරයාගේ තිබුනු දේශපාලන කැප කිරීම ගැන මට කවරදකවත් ප්‍රශ්ණයක් තිබුනේ නැත. එකට බන්ධනාගත කර සිටි කාලයේ බොහෝ සගයින් ජනතා විමුක්ති පෙරමුණ හැර දමා ගොස් සිටියදී සහ 1977 නොවැම්බර් දෙවැනි ද අප බන්ධනාගාරයෙන් නිදහස් වී දේශපාලන කටයුතු වල නිරත වෙද්දීත් අප දෙදෙනා අතර ඇති කර ගත් සම්මුතියක් තිබුනේය. එම සම්මුතිය වූයේ අප දෙදෙනා ජීවතුන් අතර සිටියදී අප දෙදෙනාගෙන් එක් අයෙක් හෝ ජනතා විමුක්ති පෙරමුණ අත හැර දමා ගියහොත් ඔහු අනෙකා ජීවතුන් අතර සිටියදී ජනතා විමුක්ති පෙරමුණට එරෙහිව දේශපාලන කටයුතු කිරීමෙන් වැලකී සිටින බවය. මෙම සම්මුතියේ වැරදි නිවැරුදි භාවය හෝ ආවේග සහගත භාවය කෙසේ වෙතත් මෙම සම්මුතිය ආරක්ෂා කරමින් කටයුතු කර තිබෙන බව මගේ සිතට එකඟව මට ප්‍රකාශ කර සිටිය හැකිය.

නිල වශයෙන් හෝ නොනිල මට්ටමෙන් හෝ ඕපාදූප ගැන කථා කරමින් ජනතා විමුක්ති පෙරමුණට හෝ ඊට සම්බන්ධව සිටි පුද්ගලයන්ට මඩ ගසන්නට මට අවශ්‍ය වූයේ නැත. එවැනි චරිතයක් වීමට අවශ්‍ය වූයේ නම් රටේ පාලක පන්තියෙන් මට තරම් අවස්ථාවන් අන් කවරෙකුටවත් ඒ සඳහා ලැබුනේ යයි මම නොසිතමි. අදටත් එවැනි චරිතයක් වන්නට මට අවශ්‍ය නැත. මෙම කරුණු මෙහි සාකච්ඡා කරන්නේ ඒ කාලයේ ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් වරයා වශයෙන් ද, විදේශ කටයුතු පිළිබඳ සහ විද්වත්, ප්‍රභූ, මධ්‍යම සහ සිංහල නොවූ ජන කොටස් සහ පැවිදි කොටස් අතර පක්ෂ කටයුතු මෙහෙයවීම පිළිබඳ කටයුතු භාර




දේශපාලන මණ්ඩල සභිකයා වශයෙන් ද, පක්ෂයේ ප්‍රකාශණ වූ රෙඩ් පවර් (Red Power), සහ සෙන් ශක්ති (බවුත රතෙවී) පත්‍රවල කතෘ වශයෙන් ද, නියමුවා පත්‍රයේ කතෘ වරයෙකු වශයෙන් ද, සමාජවාදී කලා සංගමයේ සභාපති සහ 'විමුක්ති ගී' ප්‍රසංගයේ සංවිධායක වශයෙන් ද, රෝහණ විජේවීර, කෙලී සේනානායක, වාස් තිලකරත්න සහ මහින්ද පතිරන ඇතුළු ඇතැම් සහෝදර සහෝදරියන්ට එරෙහිව වරින් වර පවත්වන ලද විනය පරීක්ෂණ කමිටුවල සාමාජිකයෙකු වශයෙන් ද ක්‍රියා කිරීම හේතුවෙන් මා සන්තකව තිබෙන්නා වූ දැනුම සහ අවබෝධය පදනම් කර ගෙනයි.

මම මෙම කරුණු හෙලිදරව් කිරීම් වල අරමුණ සත්‍යය පැහැදිලි කිරීම මිස එසේ නොමැතිව රෝහණ සහෝදරයාගේ ප්‍රතිරූපයට කිසිදු අයුරෙකින් හානියක් කිරීම නොවන බව මෙහිදී ඉඳුරා සඳහන් කළ යුතුයි. "හද රිදවන මතක සුවඳ" නාමයෙන් අතීතයේ ඇතැම් ගඳ ගසන සිද්ධීන් පිළිබඳව සාකච්ඡා කිරීමේදී සඳහන් කරන්නට සිදු වී තිබෙන සමහර කරුණු වලින් ඇතැම් සහෝදර සහෝදරියන්ට යම් ආකාරයක සිත් වේදනාවන් ඇති විය හැකි බව මම දනිමි. මම ඒ පිළිබඳව මගේ කණගාටුවද මෙයින් පල කර සිටිමි.

රෝහිත මුණසිංහ සහෝදරයා ගේ ලිපියේ සඳහන් කර තිබෙන කාන්තාවන් තිදෙනාගෙන් එක් අයකු 'වත්තල මොරීන්' සහෝදරියයි. පුත්තලම් දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් සහ ආසණ දේශපාලන කටයුතු සඳහා මොරීන් සහෝදරියත් ඇයගේ ස්වාමි පුරුෂයා වූ සහෝදරයාත් විසින් ඔවුන් පදිංචිව සිටි නිවස පරිත්‍යාගශීලී ලෙස පක්ෂයේ වැඩට යොදා ගන්නට ඉඩ කඩ දී තිබුනි. එහෙත් මුණසිංහ සහෝදරයා පවසන පරිදි එම නිවස "පක්ෂ නායකයන්ගේ පණිවිඩ හුවමාරු වන, නායකයන් යන එන මධ්‍යස්ථානයක් බවට" පත්ව තිබූනේ නැත. දේශපාලන මණ්ඩලයේ එක් රැස්වීමක් පමණක් එහි පවත්වා තිබේ.

දේශපාලන මණ්ඩලයේ රැස්වීම් එක් ස්ථානයක දෙවරක් පැවැත්වූයේ ඉතාමත්ම විරල අවස්ථාවකදී පමණකි. එහෙත් පුත්තලම් දිස්ත්‍රික්කයේ සහ එම දිස්ත්‍රික් ආසණ වල දේශපාලන කටයුතු පිළිබඳ සාකච්ඡා පැවැත්වීමට එම නිවස බොහෝ සේ ප්‍රයෝජනයට ගන්නා ලද බව සැබෑය. "මෙම අවධියේ දේශපාලන මණ්ඩලයේ රහස් කිහිපයක් පිටතට කාන්දු වූ නමුදු එම සිදුරු කොතැනක වී දැයි සොයාගත හැකි වූයේ තරමක් කල් ගත වූ පසුවය" යනුවෙන් මුණසිංහ සහෝදරයා විසින් කර තිබෙන ප්‍රකාශය මුළුමණින්ම සාවද්‍ය ය. එසේම, "වත්තල මොරින් පක්ෂයේ රහස් දැන ගැනීමට, පක්ෂයේ නායකයන් බිලී බා ගැනීමට,

රෝහණ සහෝදරයාට වසදී ඝාතනය කරන්නට හතුරන් විසින් යොදවන ලද ඔත්තු කාරියකැයි පක්ෂය විසින් පසුව නිගමනය කරන ලදී" යනුවෙන් ඔහු කර තිබෙන ප්‍රකාශය පළමුවරට මම දැන ගත්තේ මුණසිංහ සහෝදරයාගෙ මෙම ලිපිය කියවීමෙන් පසුවය. 1984 දක්වා මම සිටි ජනතා විමුක්ති පෙරමුණ නම් මෙවැනි නිගමනයකට එලැඹ සිටියේ නැත.

ජනතා විමුක්ති පෙරමුණ තුල පසුගිය මාස කිහිපයේ දී ඇති වූ ඊනියා බෙදී වෙන් වීමේදී දෙපිරිස අතර ඇති වූ මඩ ගසා ගැනීමේ ක්‍රියාවලිය දෙස සිහි නුවණින් යුක්තව බලා සිටි කෙනෙකුට නම් මේ ආකාරයෙන් පක්ෂයේ සහ පුද්ගලයින්ගේ ඉතිහාසය විකෘති කොට දැක්වීම ගැන පුදුමයක් ඇති වේයයි මම විශ්වාස කරන්නේ නැත. එහෙත් ජනතා විමුක්ති පෙරමුණු ඉතිහාසය සාකච්ඡා කිරීමේ දී මොරීන් පවුල වෙනුවෙන් ද සාධාරණය ඉෂ්ඨ විය යුතුය.


මැයි දින පෙළපාලියකට සහභාගී වෙමින් සිටින දේශපාලන මණ්ඩල සාමාජිකයෝ

ලයනල් බෝපගේ

එබැවින් මෙම සිද්ධිය සම්බන්ධයෙන් මා දන්නා කරුණු මෙහි සඳහන් කිරීමට තීරණය කලෙමි.

රෝහණ සහෝදරයාත්, මොරීන් සහෝදරියත් අතර අතර ඇති ව තිබුනු අනියම් සම්බන්ධයක් ගැන මුලින් හලාවත දිස්ත්‍රික්කයේත්, පසුව කොළඹ දිස්ත්‍රික්කයේත් කට කථා සහ දූෂමාන ආරංචි පැතිර යන්නට පටන් ගත්තේ 1982 අග භාගයේ වෙන්නට ඇත. මෙවැනි සම්බන්ධයක් ස්ථිර ලෙසම පවත්වා ගෙන ගිය බව දේශපාලන මණ්ඩලයට දැන ගන්නට ලැබුනේ උපතිස්ස ගමනායක සහ වාස් තිලකරත්න යන දේශපාලන මණ්ඩලයේ සහෝදරවරුන් හමුවේ සහ පක්ෂයේ ඇතැම් ප්‍රසිද්ධ ස්ථානවලදී මෙම සම්බන්ධතාවය ගැන රෝහණ සහෝදරයා විසින්ම කරන ලද ඉතාමත් පහත් පෙලේ සවිස්තරාත්මක සඳහන් කිරීම් තුලිනි.

මේ කරුණ ගැන දේශපාලන මණ්ඩලයේ දී සාකච්ඡා කල අවස්ථාවේදී මෙම සම්බන්ධතාවය දෙදෙනාගේම කැමැත්තෙන් පවත්වා ගෙන යන්නක් බව රෝහණ සහෝදරයා පිළිගත් අතර, එවැනි සම්බන්ධතා වැරදි සහගත නොවේ යයි තර්ක කිරීමට කාර්ල් මාක්ස් ගේත් මාඕ සේ තුං ගේත් පෞද්ගලික ජීවිත කථාද ඇද ගන්නා ලදී. එහෙත් දේශපාලන මණ්ඩලයේ වැඩි දෙනෙකු ඉදිරිපත් කොට සිටි අදහස වූයේ රෝහණ සහෝදරයා විවාහකයෙක් ව සිටියදී මෙවැනි සම්බන්ධතාවයක් පවත්වා ගෙන යෑම වැරදි

34 වන පිටුවට